www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද-පකිස්ථාන සබඳතා තවමත් කැකෑරෙන තත්වයක

**US-Pakistani relations remain on the boil**

**කීත් ජෝන්ස් විසිනි**
**2008 සැප්තැම්බර් 20**

මේ සතියේ දී ඉස්ලාමාබාද් නුවරට හදිසියේ කල සංචාරයක දී, එක්සත් ජනපදයේ ඒකාබද්ධ මිලිටරි ප්‍රධානින්ගේ කාර්ය මන්ඩලයේ සභාපති අද්මිරාල් මයිකල් මුලන්, එක්සත් ජනපදය පකිස්ථානයේ ස්වෛරී භාවයට ගරු කරන බවට එරට ආන්ඩුවට හා මිලිටරියට සහතිකයක් දුන් බව කියැවේ. එහෙත් ඉන් යන්තම් පැය කිහිපයකට පසුව, එක්සත් ජනපදය පකිස්ථානය තුල තවත් මාරාන්තික ඩ්‍රෝන් ප්‍රහාරයක් එල්ල කරමින් දකුනු වසිරිස්ථාන් ගම්මානයක අඩු ගනනේ හය දෙනෙකු මරා දැම්මේ ය.

පකිස්ථාන අගමැති රසා ගිලානි එම ඩ්‍රෝන් ප්‍රහාරය හෙලා දැක්කේ ය. පකිස්ථාන බලධාරීන් අවධාරනය කලේ, එම ප්‍රහාරය එල්ල කරනු ලැබුවේ, ඔවුන්ගේ අනුමැතියෙන් තොරව පමනක් නොව ඔවුන්ට කිසිදු අනතුරු ඇඟවීමකින් පවා තොරව බව යි.

මුලන්ගේ සංචාරය විස්තර කෙරුනේ "ආතතීන් සමනය කිරීමේ" ප්‍රයත්නයක් ලෙස ය. සැප්තැම්බර් 3 දා පකිස්ථානයට එල්ල වූ පෙර නොවූ විරූ එක්සත් ජනපද මිලිටරි ප්‍රහාරය ද ඉස්ලාමාබාද් පාලනයේ අවසරයකින් තොරව පකිස්ථානය තුල මෙහෙයුම් ගෙන යාමට එක්සත් ජනපද විශේෂ මෙහෙයුම් බලකායට බලය පවරමින් ජුලි මස මැද ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් ජනාධිපති නියෝගයකට අත්සන් තැබූ බව ඉන් පසුව එළිදරව් වීම ද මගින් එක්සත් ජනපද-පකිස්ථාන සබඳතා තුල ප්‍රකුපිත කෙරුනු අර්බුදය සඳහා යොදා ගැනෙන යහනාමය "ආතතීන්" යන්න ය.

සැප්තැම්බර් 3 ප්‍රහාරයෙන් පසු දින කිහිපයක් තුල, පකිස්ථානයේ පාර්ලිමේන්තුව, ඉදිරියේ දී එල්ල වන එවන් ප්‍රහාරයක් බලය යොදා ව්‍යවර්ථ කරන බව ප්‍රකාශ කල යෝජනාවක් ඒකමතිකව සම්මත කල අතර, පකිස්ථානයේ මිලිටරි ප්‍රධානි ජෙනරාල් අෂ්ෆාක් කයානි ඇතුලු, පකිස්ථාන පාලන සංස්ථාපිතයේ ඉහල පෙලේ සාමාජිකයෝ අනාගත එක්සත් ජනපද ප්‍රහාරවලට ප්‍රතිරෝධය දක්වන බවට පොරොන්දු වූහ.

සඳුදා, බදාදා ඩ්‍රෝන් ප්‍රහාරය හා සැප්තැම්බර් 3 ප්‍රහාරය එල්ල වූ ස්ථානයට ඉතා ආසන්නයෙන් පකිස්ථානය තුලට ඇතුලු වීමට උත්සාහ කල එක්සත් ජනපද මිලිටරි හෙලිකොප්ටර් දෙකකට පකිස්ථාන හමුදාවන්ගේ වෙඩි ප්‍රහාර හේතු කොට ගෙන ආපසු හැරී යාමට බල කෙරුනු බව වාර්තා විය.

පකිස්ථාන ආරක්ෂක හමුදා නිලධාරියකු මෙසේ පැවසුවේ යැයි *රොයිටර්* වාර්තාවක සඳහන් විය: "එක්සත් ජනපද චොපර් අන්ගෝර් අඩා ප්‍රදේශයෙන් යන්තම් මීටර් 100ක 150ක දුරක් පකිස්ථානය තුලට ආවා. එහෙම වුනත් අපේ හමුදා ඒව අත ඇරියෙ නැහැ. ඔවුන් ඒවාට වෙඩි තිබ්බා. ඒවා ආපසු හැරී ගියා."

එක්සත් ජනපද සහ පකිස්ථාන ආන්ඩුව එවන් ගැටුමක් සිදු වූ බව පැහැදිලිව ම ප්‍රතික්ෂේප කලේ ය. නිල පකිස්ථාන මිලිටරි වාර්තාවෙන් කියැවෙන්නේ, එක්සත් ජනපද චොපර් යානාවලට වෙඩි ප්‍රහාර එල්ල වූ බවත් ඒත් ඒ පකිස්ථාන මිලිටරි හමුදාවන්ගෙන් නොව ප්‍රාදේශීය ගෝත්‍රික ජනයාගෙන් බව යි. එමෙන් ම චොපර් යානා කොහෙත්ම පකිස්ථාන ගුවන් සීමාවට ඇතුලු නොවූ බව ද එම වාර්තාව කියයි. මේජර් මුරාඩ් ඛාන් ඩෝන් පුවත්පතට පැවසූ පරිදි, "අනෙක් අයට වගේ ම, . . . එම ප්‍රදේශයේ රඳවා තිබූ අපේ හමුදාවන්ට ද වෙඩි සද්දයක් ඇහුනා. ඒත් එය ආවෙ කොහෙන් ද ඉලක්කය මොකක් වුනා ද කියන දේවල් අපි දන්නෙ නැහැ."

සෙසු වාර්තා මෙයට ප්‍රතිවිරෝධී ය. අසල පිහිටි වයඹදිග දේශ සීමා පලාතේ ආන්ඩුකාර ඔවායිස් අහමඩ් ඝානි අගහරුවාදා විකාශනය වූ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක දී කෙලින් ම මෙසේ පැවසී ය: "කඩා වැදීමක් සිදු වූ බව මගේ දේශපාලන පාලනාධිකාරය වාර්තා කර තියෙනවා. එයට ප්‍රතිචාර වසයෙන්, ජනතාවත් නීතිය බලාත්මක කරන නිලධාරීනුත් ක්‍රියාත්මක වුනා."

ව්‍යර්ථ කෙරුනු එක්සත් ජනපද කඩා වැදීමට දිනකට පසුව, මිලිටරියේ මාධ්‍ය සබඳතා අංශයේ ප්‍රධානි මේජර් ජෙනරාල් අතාර් අබ්බාස් ඇසෝසියේටඩ් ප්‍රෙස් පුවත් සේවයට පැවසුවේ, පකිස්ථානය තුලට ඇතුලු වීමේ එක්සත් ජනපද හමුදා ප්‍රයත්නයක දී," ආඥාවන් පැහැදිලි ය. . . . ඉතා නිශ්චිත, කිසිදු දෙගිඩියාවක් නැති, දේශ සීමා හරහා වන, ගොඩබිමින් හෝ ගුවනින් සිදු වන, කඩා වැදීමක් ඉතා සැලකිය යුතු ආකාරයකින් හඳුනා ගත හොත්ඃ වෙඩි තබනු."

මුලන් අගහරුවාදා බැග්ඩෑඩ් සිට ඉස්ලාමාබාද් කරා ගුවනින් ගියේ ය. එය ඔහු එක්සත් ජනපද මිලිටරි ප්‍රධානියා බවට පත් වූ දා සිට මේ වන තෙක් ගතව ඇති මාස 11ක කාලය තුල පකිස්ථානයට කල ඔහුගේ පස් වන සංචාරය යි. *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයට අනුව, මුලන් පකිස්ථානයට යා යුතු ය යන තීන්දුව ගනු ලැබුවේ ඔහු ඉරාකය බලා පිටත් වීමෙන් පසුව ය. එමගින් බලගතු ලෙස යෝජනා කෙරෙන්නේ එය සඳුදා සිද්ධියට ප්‍රතිචාර වසයෙන් ගත් තීන්දුවක් බව යි.

පකිස්ථාන ආන්ඩුව හා මිලිටරි නායකයන් සමග මුලන් පැවැත්වූ" සාකච්ඡා . . . අතිශයින් ම විවෘත, ධනාත්මක හා ඵලදායී" වූ බව එක්සත් ජනපද තානාපති කාර්යාල ප්‍රකාශයක් කියාපෑවේ ය.

## යුද ක්‍රියාවක්

සැප්තැම්බර් 3 ප්‍රහාරයත් ජනාධිපති ආඥාවත් යුද ක්‍රියාවකට නොඅඩු දෙයකි, ඒවායින් අවධාරනය කෙරෙන්නේ, රාජ්‍යවල ස්වෛරී භාවය හා ජාත්‍යන්තර නීතිය තුට්ටුවකට මායිම් නොකර ලෝකයේ ඕනෑම තැනක මිලිටරි මැදිහත්වීමක් කිරීමේ නිර්බාධිත අයිතිය වොෂිංටනය තමන්ට ආරෝපනය කර ගන්නා බව යි.

ඒවාට ප්‍රතිචාර ලෙස එක්සත් ජනපදය තුල දේශපාලනමය හා මාධ්‍යමය අදහස් දැක්වීම් මතු වී නැති තරම් නම්, එයට හේතුව වන්නේ, එක්සත් ජනපදය ඇෆ්ඝනිස්ථානය තුල යුද්ධය උත්සන්න කිරීමටත් එය පකිස්ථානයේ දේශ සීමා කලාප තුලට දීර්ඝ කිරීමටත් පක්ෂව වොෂිංටනයේ බලගතු ද්වි-පාර්ශ්වික ඒකමතික භාවයක් පැවතීම යි. පකිස්ථානය තුල ඒකපාර්ශ්වීය එක්සත් ජනපද මිලිටරි ප්‍රහාර සඳහා අන දීමට තමන් සූදානම් බවට ඩිමොක්‍රැටික් ජනාධිපති අපේක්ෂක බැරක් ඔබාමා යලි යලිත් පවසා තිබේ.

කාබුල්හි එක්සත් ජනපදය විසින් පටවන ලද ආන්ඩුව වඩ වඩා හුදකලාවට අපකීර්තියට ලක් වන කොන්දේසි යටතේ, පකිස්ථානය ඇෆ්ඝන් කැරලිකරුවන් සඳහා "ආරක්ෂිත පාරාදීසයක්" ලෙස සේවය කරන්නේ ය යන තර්කයට එක්සත් ජනපදය සහ එහි නැටෝ සගයන් බොහොමයක් තදින් ඇලී තිබේ.

යථාර්ථය නම්, ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑම පකිස්ථානයේ දේශ සීමා කලාපවල කැරලිකාරිත්වයක් පැන නැගීමට තුඩු දී තිබේ. එම කලාපවල ජනයා බ්‍රිතාන්‍ය විජිත පාලකයන් විසින් පනවන ලද දේශ සීමා කිසිදාක පිලිගත්තේ නැත. ඇෆ්ඝනිස්ථානය තුල එක්සත් ජනපද මැදිහත්වීමට එරෙහි කෝපය, ප්‍රදේශයේ පවත්නා නිදන්ගත සමාජ-ආර්ථික පසුගාමිත්වය සහ එම කලාප සම්බන්ධයෙන් ඉස්ලාමාබාද් පාලනයේ සම්ප්‍රදායික නොතැකීම එම කැරලිකාරිත්වය ඇවිලවීමට හේතු වී තිබේ. එසේ ම ඒ සඳහා බලපා ඇති අවසන් හා එහෙත් වැදගත්කමින් අඩු නොවන හේතුව නම්, ඇෆ්ඝන් කැරලිකාරිත්වයට පවත්නා සහයෝගය මැඩීමේ ප්‍රයත්නයක් වසයෙන් වොෂිංටනයේ ඉල්ලීම පරිදි පකිස්ථාන මිලිටරිය යොදා ගෙන ඇති මෘග මර්දන විධි ක්‍රම ය. බෝම්බ වැසි වැස්සවීම," අතුරුදහන් කිරීම්" සහ විජිත පාලන කාලයේ දී මෙන් සාමූහික දඬුවම් මෙම විධි ක්‍රමවලට ඇතුලත් ය.

මෑත සතිවල දී, පකිස්ථාන මිලිටරිය ෆෙඩරල් පාලනය යටතේ පවතින ග්‍රෝතික ප්‍රදේශ (එෆ්ඒටීඒ) තුල වඩා වැඩි අධිකාරියක් ලබා ගැනීමට උත්සාහ කරන තතු යටතේ සිය ගනන් ඝාතනයට ලක්ව තිබේ. දස දහස් සංඛ්‍යාත ජනයා කලාපයෙන් පලා ගොස් ඇත්තේ, මිලියන 3.5කට මදක් වැඩි ජනගහනයකට නිවහන වන එෆ්ඒටීඒ ප්‍රදේශයේ සරනගත ජනගහනය 300,000කට අධික ගනනක් බවට පත් කරමිනි.

හිටපු හමුදා ප්‍රධානි සහ ආඥාදායක පර්වේස් මුෂාරෆ් විස්ථාපනය කරමින් පකිස්ථාන මහජන පක්ෂයේ (පීපීපී) සභාපති අසිෆ් අලි සර්දාරි ජනාධිපති ලෙස නිල වසයෙන් දිවුරුම් දීමට නියමිතව තිබිය දී දින කිහිපයකට පෙර එල්ල කෙරුනු සැප්තැම්බර් 3 එක්සත් ජනපද ප්‍රහාරය පකිස්ථාන ප්‍රභුව අපහසුතාවකට ඇද දැමී ය.

එක්සත් ජනපදය ඔහු සමග වැඩ කරනු ඇති බවත් එහෙත් එසේ වන්නේ ඔහු එක්සත් ජනපදයේ අවශ්‍යතාව අනුව ක්‍රියා කරමින් රටේ දේශ සීමා ප්‍රදේශවල කැරලි මර්දන යුද්ධය උත්සන්න කරන තාක් දුරට පමනක් බවත් සර්දාරිට තථ්‍ය වසයෙන් දැනුම් දෙන ලදි.

වසර ගනනාවක් තිස්සේ, වොෂිංටනය, ආඥාදායක මුෂාරෆ් "ත්‍රස්ත විරෝධී යුද්ධයේ" අත්‍යවශ්‍ය සගයකු ලෙස නම් කරමින්, ඔහුට බලගතු ලෙස පිටුබලය සැපයී ය. දැන් මහජන විරුද්ධත්වයේ හා ආර්ථික අර්බුදයේ ඒකාබද්ධ බර යටතේ දැන් ඔහුගේ තන්ත්‍රය බිඳ විසිරී ඇති තතු යටතේ, වොෂිංටනය, නව "ප්‍රජාතන්ත්‍ර" ආන්ඩුව මත පීඩනය උත්සන්න කරන්නේ එය තමන්ගේ ම ජනතාවගේ ප්‍රාර්ථනා හා අභිලාෂයන් නොතකා වොෂිංටනය වෙනුවෙන් යුද්ධය ගෙන යා යුතු යයි ඉල්ලමිනි.

යුද්ධයට සම්බන්ධිතව ඔවුන් එක්සත් ජනපදයට යටත් වීමත් වොෂිංටනයේ ඉල්ලීම පරිදි මුෂාරෆ් සමග සන්ධානයක් තනා ගනු වස් ඔවුන් දිගු කලක් තිස්සේ කාලය කා දමමින් ගෙන ගිය වැඩකටයුතුත් නිසා සර්දාරිගේ හා පකිස්ථාන මහජන පක්ෂයේත් ජනප්‍රියත්වය විශාල වසයෙන් කඩා වැටී ඇති බව මත විමසුම්වලින් යලි යලිත් පෙන්නුම් කර තිබේ.

පෙන්ටගනය සමග දශක ගනනාවක දීර්ඝ සමීප සබඳතාවක් පවතින මිලිටරිය සම්බන්ධයෙන් ගත හොත්, එක්සත් ජනපද මිලිටරි කඩා වැදීම් එහි කීර්තියට දැවැන්ත පහරක් වන අතර කැරලි මර්දන යුද්ධය තුල මිලිටරියේ ක්‍රියාකලාපය අරබයා එහි සාමාජිකත්වය තුල පවත්නා ආතතීන් එමගින් තව දුරටත් තීව්‍ර විය හැකි ය.

හමුදාවේ නිලධාරි කොටස් තුල සිටින බොහෝ දෙනෙක්, ජෙනරාල් සියා උල්-හක් නමැති ආඥාදායකයා විසින් වගා දිගා කරන ලද රුදුරු ඉස්ලාම් පකිස්ථාන ජාතිකවාදයට සහයෝගය දෙයි. 1977 සිට 1988 දක්වා කාල පරිච්ඡේදය තුල වොෂිංටනයේ පූර්න සහයෝගය සහිතව පකිස්ථානය පාලනය කල මෙම ආඥාදායකයා, කාබුල්හි සෝවියට් පිටුබලය සහිත ආන්ඩුවට විරුද්ධ ඉස්ලාම් මූලධර්මවාදින් වෙත එක්සත් ජනපද හා සවුදි සහයෝගය ලබා දුන් මාධ්‍යය ලෙස පකිස්ථාන මිලිටරියේ නැගී ඒමට නායකත්වය දුන්නේ ය.

එමෙන් ම, හමුදා නිලධාරි කොටස් තුල පස්තුන් ජනවර්ගයේ බලගතු නියෝජනයක් පවතී. එක්සත් ජනපදය වෙනුවෙන්, තමන්ගේ ම සහෝදර ජනයා -- පකිස්ථාන-ඇෆ්ඝන් දේශ සීමාව හරහා දෙපසේ ම ජීවත් වන පස්තුන් ජනයා -- මර්දනය කිරීමට සිදු වීම සම්බන්ධයෙන් මෙම ස්ථරය විශේෂයෙන් ම කෝපයට පත්ව ඇතැයි ප්‍රවෘත්ති වාර්තා යෝජනා කරයි.

සමස්තයක් ලෙස මිලිටරිය සම්බන්ධයෙන් ගත හොත්, එක්සත් ජනපදය පකිස්ථාන ස්වෛරී භාවය උල්ලංඝනය කිරීම, එහි නීතියුක්ත භාවයට අභියෝග කිරීමකට සම වෙයි. දශක ගනනාවක් තිස්සේ, පකිස්ථාන මිලිටරිය, දැවැන්ත වැය ශීර්ෂයකට සහ දේශපාලන බලයේ තීරනාත්මක පංගුවකට කියාපන සිය අයිතිවාසිකම යුක්තියුක්ත කිරීමට උත්සාහ කර ඇත්තේ, පකිස්ථානයේ අඛන්ඩතාව රැක ගැනීමට හැකි එක ම සංස්ථාව තමන් ය යන පදනම මත ය.

## නව අවබෝධයක්?

*ඩෝන්, නිව් යෝර්ක් ටයිම්ස්* සහ *වොෂිංටන් පෝස්ට්* ඇතුලු, විවිධ මනා ඉහල සම්බන්ධතා සහිත පුවත්පත්වල මෑත දිනවල පලව ඇති ලිපිවලට අනුව, පකිස්ථානය තුල භටයන් යොදා ගෙන මිලිටරි මෙහෙයුම් ගෙන යාමට තමන්ට අයිතියක් ඇතයි වොෂිංටනය නිර්භය ලෙස කියාපෑම සම්බන්ධයෙන් පකිස්ථාන මිලිටරියේ පවත්නා විරුද්ධත්වය උත්සන්න වීම, බුෂ් පාලනාධිකාරයට මදක් නතර වී සිතා බැලීමට බල කර ඇත.

සැප්තැම්බර් 3 ප්‍රහාරයට ක්ෂනික ඉක්බිතිව, පකිස්ථාන බලධාරීහු, අපැහැදිලි ආරක්ෂක උත්සුකතා ගැන සඳහන් කරමින්, ඇෆ්ඝනිස්ථානයේ සිටින එක්සත් ජනපද හා නැටෝ හමුදාවන්ට පකිස්ථානය හරහා සැපයුම් ප්‍රවාහනය කරන ඉතා ම වැදගත් ගොඩබිම් මාර්ග තාවකාලිකව වසා දැමී ය.

බ්‍රිතාන්‍ය නීතිය හා යුක්තිය පිලිබඳ ලේකම් ජැක් ස්ට්‍රෝ, ඉස්ලාමාබාදයට කල සංචාරයක දී ම කාරනාවට සැඳහුම් කලේ ය. බ්‍රිතාන්‍යය පකිස්ථානයේ ස්වෛරී භාවයට සහාය දෙන බවට කියාපෑමෙන් පසුව, ස්ට්‍රෝ, "පකිස්ථානය සිය භූමි ප්‍රදේශ හරහා ඇෆ්ඝනිස්ථානය වෙත යන නැටෝ සැපයුම් රථවලට මාර්ග පහසුකම් සැපයීම දිගට ම කරගෙන යනු ඇති බවට බලාපොරොත්තු පල කල්" බවට පකිස්ථාන පුවත්පත් වාර්තා කරයි.

නම සඳහන් නොකරන මූලාශ්‍ර උපුටා දක්වන එම පුවත්පත් වාර්තා සත්‍ය නම්, එෆ්ඒටීඒ ප්‍රදේශ තුල ආක්‍රමනික මෙහෙයුම් ගෙන යාමේ දී වඩ වඩා "සහයෝගි වීම්" සහ ඝාතක ඩ්‍රෝන් ප්‍රහාර දියත් කරනු පිනිස වඩ වඩා නිදහස ලබා දීම සඳහා හිලව් වසයෙන් පකිස්ථාන භූමි ප්‍රදේශ තුලට තව දුරටත් විශේෂ මෙහෙයුම් සඳහා කඩා වැදීම් නොකිරීමට වොෂිංටනය, අඩු ගනනේ මේ අවස්ථාවේ, එකග වී ඇත.

මුෂාරෆ්ගේ පාලනය යටතේ පකිස්ථානයේ දේශ සීමා කලාප තුල ඩ්‍රෝන් මිසයිල ප්‍රහාර දියත් කරනු පිනිස සීඅයිඒ සංවිධානයට අයිතිය ලබා දුන් බව විවෘත රහසකි. සත්තකින් ම, *නිව් යෝර්ක් ටයිම්ස්* මේ වසර මුලදී වාර්තා කල පරිදි, සීඅයිඒ සංවිධානයට පකිස්ථානය තුල ඩ්‍රෝන් කඳවුරක් තිබේ.

"පකිස්ථානය සිය භූමි ප්‍රදේශ තුල එක්සත් ජනපද පාබල හමුදාවන්ට ඉඩ නොදෙනු ඇති නමුදු, එක්සත් ජනපද මිසයිල ප්‍රහාර වැඩි වැඩියෙන් ඉවසා සිටීමට එයට සිදු වනු ඇති" බව "සිය අනන්‍යතාව සඳහන් කිරීමට අකමැති ජ්‍යෙෂ්ඨ පකිස්ථාන රාජ්‍යතාන්ත්‍රිකයෙක්" පැවසුවේ යයි සිකුරාදා *ඩෝන්* පත්‍රය වාර්තා කලේ ය.

"කෙසේ වෙතත්, එෆ්ඒටීඒ ප්‍රදේශ තුල එක්සත් ජනපද මිසයිල ප්‍රහාරවලට එරෙහි මහජන හැඟීම්, ගුවන් ප්‍රහාර ද සමහර විට හෙලා දැකීමට පකිස්ථාන බලධාරීන්ට බල කරනු ඇත යයි රාජ්‍යතාන්ත්‍රිකයා පැවසී ය."

සමහර විට එවන් එකගතාවක් පිලිබඳව සංඥා කරමින්, එක්සත් ජනපද නියෝජ්‍ය රාජ්‍ය ලේකම් ජෝන් නෙග්‍රොපොන්ටේ අඟහරුවාදා මෙසේ පැවසී ය:

"ඒකපාර්ශ්වීය ක්‍රියා බොහෝ විට දිගු කාල පරිච්ඡේදයක් තිස්සේ ගත් කල කල් පවත්නා හෝ ශක්‍ය විසඳුමක් නොවේ. මා සිතන්නේ අප දෙරටට ම හොඳම ඉදිරි පියවර වන්නේ සහයෝගී පදනමක් මත එම දේශ සීමා ප්‍රදේශ තුල තත්වය සමග පොර බැඳීමට උත්සාහ කිරීම බව යි."

බුෂ් පාලනාධිකාරය පකිස්ථානය තුලට විශාල පරිමානයේ ප්‍රහාර එල්ල කිරීමේ ඉවබවක් නැති, විවෘතව ම නීති විරෝධී පිලිවෙතින් ඉවතට හැරී ඇතුවා වුනත්, වොෂිංටනය හා ඉස්ලාමාබාද් අතර අටවා ගෙන ඇති මොන යම් හෝ එකගතාවක් අතිශයින් ම අස්ථායි වනු ඇත.

එක්සත් ජනපදය විසින් පිහිටුවන ලද හමිඩ් කර්සායිගේ ඇෆ්ඝන් තන්ත්‍රයේ සහයෝගී පදනම් ශීඝ්‍රයෙන් ඛාදනය වෙමින් තිබෙන අතර යුද්ධයේ බරෙන් හැකි තාක් ප්‍රමානයක් පකිස්ථානය මත හෙලීමට උත්සාහ කිරීමෙහි ලා බලගතු දේශපාලන හා මිලිටරි අවශ්‍යතාවක් කර්සායි තන්ත්‍රය හා එක්සත් ජනපදය යන දෙපාර්ශ්වයට ම පවතී.

ප්‍රධාන ඔත්තු සේවා ඒජන්සිය වන අයිඑස්අයි මත මිලිටරියට ඇති තීරනාත්මක පාලනය ඉවත් කිරීම වැනි, පකිස්ථානයේ මිලිටරිය සහ එහි සිවිල් ආන්ඩුව අතර ඝර්ෂනයන් වැඩි දියුනු කිරීමට ඉඩ ඇති සෙසු ඉල්ලීම් ද එක්සත් ජනපදය දිගට ම අවධාරනය කරයි.

ඉන්දියාව, පකිස්ථානයේ දුර්වලත්වය හඳුනා ගනිමින් ද අඩු ගනනේ ආංශික වසයෙන් වොෂිංටනය සමග සංයෝගීව ක්‍රියා කරමින් ද සිය ප්‍රධාන ප්‍රතිවාදියා මත පීඩනය උත්සන්න කිරීමේ දිගට ම යෙදී සිටී. මෑත දිනවල දී, නව දිල්ලිය ඉන්දියාවේ අගනුවර සිදු වූ ත්‍රස්ත බෝම්බ පිපිරීම්වලට පකිස්ථානය සම්බන්ධ බවට වක්‍රව පවසා කාශ්මීරය තුල නව ප්‍රහාරක ජෙට් යානා ස්ථානගත කොට, පකිස්ථානයේ පංජාබ් පලාතට යන චෙනුබ් ගංගාවේ ජල ප්‍රවාහය ඒකපාර්ශ්වීයව අඩු කර තිබේ.

අවසන් එහෙත් වැදගත්කමින් අඩු නොවන කාරනාව නම්, ඇෆ්ඝනිස්ථානයේ මිලිටරි වාඩිලෑම ද පකිස්ථානය තුල කැරලි මර්දන යුද්ධය ද ඉස්ලාමාබාද්හි මිලිටරි පාලනය නඩත්තු කිරීමේ හා සිය ගෝලීය අධිරාජ්‍යවාදී මූලෝපායේ ඉත්තකු ලෙස පකිස්ථානය පාවිච්චි කිරීමේ එක්සත් ජනපදයේ දශක ගනනාවක් දිගු පිලිවෙත ද මගින් අවුලුවනු ලබන එක්සත් ජනපද විරෝධී මනෝගතිය තව දුරටත් දිගට ම වර්ධනය වීම යි.

© www.wsws.org